ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය- 2010

-------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---------------------------------------

1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

-----------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණනයට ඉදිරිපත් කළයුතු වුවද, මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

විගණනයේදී පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩ නිරීක්ෂණය විය.

(අ) කළමනාකරණය පිළිබඳ පශ්වාත් උපාධි ඩිප්ලෝමාව හා "Extramural" අධ්‍යයනයන්ට අදාල ගනුදෙනුවල වටිනාකම විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල ඒකාබද්ධ කර නොතිබුණි.

(ආ) බැංකු ගිණුම් 04 ක ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) ගුණාත්මක උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය වැඩි දියුණු කිරීම ව්‍යාපෘතිය යටතේ (IRQUE) ප්‍රසම්පාදනය කරන ලද ප්‍රාග්ධන විෂයයන් විශ්ව විද්‍යාලයේ ඉන්වෙන්ටරියට මාරු කර තිබුණද, එම වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සාවද්‍ය ගිණුම්කරණය හේතුවෙන් කුලී ගාස්තු රු.220,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) කාර්ය මණ්ඩලයට ලබා දෙන ලද ණයවලින් වැඩිපුර අය කරන ලද රු.295,631 ක් වගකීම් ගිණුමට බැර කරනු වෙනුවට ණය සහ අත්තිකාරම් ගිණුමට බැර කර තිබුණි.

(ඊ) 2006 වර්ෂය තුළදී මධ්‍යම පරිසර අධිකාරියෙන් ලැබුණු රු.9,555,427 ක් වටිනාකම වූ රසායනාගාර උපකරණ ගිණම්වලට ගෙන නොතිබුණි.

### 1.2.3 බැංකු සැසඳුම් ප්‍රකාශනවල අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපලබ්ධි නොවූ තැන්පතු ලෙස රු.1,527,243 ක් බැංකු සැසඳුම් ප්‍රකාශනයේ දක්වා තිබුණි. කෙසේ වුවද, ඒ පිළිබඳ විමර්ශනය කර ගිණුම්වල අදාල ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වෙන පිළිවෙලින් වටිනාකම රු.5,704,648 ක් හා රු.4,952,914 ක් වූ ඍජු බැර හා ඍජු හර සම්බන්ධයෙන් විමර්ශනය කර ගිණුම්වල අදාල ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මාස 06 කට වැඩි කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ රු.4,868,510 ක් වටිනාකම වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා බැංකු ගිණුම් 3 ක් සම්බන්ධයෙන් වූ බැංකු සැසඳුම් ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) සමාලෝචිත වර්ෂය තුළදී පහත දැක්වෙන බැංකු ගිණුම්වල ගනුදෙනු මුදල් පොත, ගෙවීම් වවුචර්, බැංකු ප්‍රකාශන සහ වෙනත් වැදගත් ලියකියවිලි හා වාර්තා නොතිබීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

| ව්‍යාපෘතියේ නම | බැංකුවේ නම | ගිණුම් අංකය |
|---|---|---|
| තිරසාර කෘෂිකර්ම සම්පත්කළමනාකරණ මධ්‍යස්ථානය (SENSARM) | මහජන බැංකුව | 1070025055 |
| සාමාන්‍ය ඉංග්‍රීසි ප්‍රවීණතාවය (GEP) | ලංකා බැංකුව | 0002920232 |
| සුනාමි ප්‍රතිස්ථාපන ව්‍යාපෘතිය (CIDA) | ලංකා බැංකුව | 63074830 |
| නෝර්වීජියානු විද්‍යා හා තාක්ෂණ විශ්ව විද්‍යාලය (NTNU) | ලංකා බැංකුව | 6312188 |
| ව්‍යවසාය නිර්මාණ මාර්ගයෙන් ප්‍රවීණතාව පදනම් ආර්ථික විද්‍යාව (CEFE) | මහජන බැංකුව | 1-67-002475-2 |
| සමාජ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (CSRD) | ලංකා බැංකුව | 0002920179 |

(ආ) ගිණුම්වල විෂයයන් 04 කට අදාලව එකතුව රු.5,419,240 ක් වූ පැමිණීම් ලේඛන, ගෙවීම් පිළිබඳ පදනම, ගිවිසුම්, මිල කැඳවීම්, ගමන් පිළිබඳ ලියකියවිලිවල පිටපත්, වැනි ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දක්වා ඇති පරිදි රජයේ මුදල් රෙගුලාසිවලට, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයට සහ චක්‍රලේඛ උපදෙස්වල නොයෙකුත් විධිවිධානවලට අනුකූල නොවීම් විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයාගේ අවධානයට වර්න්වර යොමු කරන ලදී.

(i) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 109 සහ 110 වගන්ති.

(ii) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 සහ 155 වගන්ති.

(iii) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය.

(iv) මුදල් රෙගුලාසි අංක 138, 395(ආ), 396(ඇ), 685, 700(3), 700(5), 756, 757, 835(2)(ඇ), 835(3) සහ 850

(v) 2001 අගෝස්තු 07 දිනැති අංක 15/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

(vi) 2008 - 2010 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා මෙම වාර්තාවේ දිනය දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

---------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රු.393,635,000 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පසුව රු.449,144,987 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු.365,961,000 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පසුව රු.437,418,960 ක ඌනතාවයක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.11,726,027 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

#### 2.1.2 පර්යේෂණ ප්‍රදාන උපයෝජනය

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පර්යේෂණ ප්‍රදාන සම්බන්ධයෙන් එක් එක් ව්‍යාපෘතියට අදාලව විශ්ව විද්‍යාලය විසින් වෙනම වාර්තා පවත්වා නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිවලට අදාළ ගිවිසුම් පිළිබඳ විස්තර, පර්යේෂණ කමිටුවේ අනුමැතිය සහ පර්යෙෂණ වාර්තා එකී වාර්තාවල ඇතුළත් වී නොතිබුණි. ඒවා නොමැතිවීම හේතුවෙන් එම පර්යේෂණ ප්‍රදානයන් උපයෝගී කර ගනිමින් අදහස් කළ අරමුණු ඉටුකර ගත්තේද යන්න පිළිබඳව විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

2.1.3 **වත්කම් කළමනාකරණය**

--------------------------

(අ) ගිණුම්වල දැක්වෙන එකතුව රු.439,447,855 ක් වූ ස්ථාවර වත්කම් වටිනාකම පොත් අගය මත පදනම් වී තිබුණි. කෙසේ වුවද, මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයට මෙම වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) වර්ෂ 5 කට වැඩි කාලයක් උපයෝජනය කිරීමෙන් තොරව රු.931,890 ක් වටිනාකම වූ ලිපිද්‍රව්‍ය විෂයයන් 28 ක් ගබඩාව තුළ පැවතුණි.

2.1.4 **හඳුනා ගන්නා ලද පාඩු**

-------------------------

(අ) 1990 වර්ෂයේදී සිදුවූ රු.17,860,815 ක පාඩු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු නමුත් අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල එය විලම්බිත ගාස්තු ලෙස හෙළිදරව් කර තිබණි.

(ආ) විදුලි බිල්පත් ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් රු.97,098 ක් පොලී ලෙස ගෙවා තිබුණි.

2.1.5 **වටිනා "Casuarinas" ගස් 27 ක් කපා ඉවත් කිරීමේදී සිදු වූ අක්‍රමිකතා**

-------------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) "Casuarinas" (Savukku) සහ "Vakkai" ගස් කැපීමේදී හා ඉවත් කිරීමේදී 2006 - ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 1.14.2 වගන්තිය ප්‍රකාරව ටෙන්ඩර් / මිල කැඳවීම් පරිපාටිය අනුගමනය කර නොතිබුණි. ඒ වෙනුවට වෙළඳපොල වටිනාකම අනුව ඇස්තමේන්තුගත පිරිවැය රු.500,000 ක්වූ වටිනා ගස් වර්ග 27 ක් රු.70,000 කට කපා ඉවත් කර ගැනීම සඳහා මොරකොට්ටනච්චේනයි පෞද්ගලික වඩු වැඩ කම්හලක් 2009 මාර්තු 16 දින තෝරා ගෙන තිබුණි.

(ආ) ගස් කැපීමට හා ඉවත් කිරීමට ඉහත කම්හල තෝරා ගෙන 2009 මාර්තු 16 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණද, ගස් ඉවත් කරගෙන තිබුණේ මාස 18 ක් ඉකුත් වීමෙන් පසු 2010 ඔක්තෝබර් මාසයේදීය.

(ඇ) කොන්ත්‍රාත්තුවේ උපලේඛනය අනුව, ගස් 20 ක් පමණක් කපා දැමීමට අනුමැතිය ලබා දී තිබුණද, ගස් 27 ක් බිම දමා විශ්ව විද්‍යාල පරිශ්‍රයෙන් වංචා සහගතව ඉවත් කරගෙන තිබුණු බව 2010 ඔක්තෝබර් 16 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය.

(ඈ) ගස් කැපීම හා ඉවත් කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සභාවේ හෝ උපකුලපතිවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ඒ වෙනුවට, සභාවේ අනුදැනුමකින් තොරව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, වැඩබලන මූල්‍යාධිකාරී හා වැඩ බලන ලේඛකාධිකාරී විසින් කොන්ත්‍රාත්තුව අනුමත කර තිබුණි.

(ඉ) ගස් කපා බිම දැමීමට ප්‍රථම වන සම්පත් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන නොතිබුනු අතර, එම දෙපාර්තමේන්තුවෙන් බලපත්‍රයක්ද ලබාගෙන නොතිබුණි.

(ඊ) කොන්ත්‍රාත්තුව පිරිනැමීමට ප්‍රථම රාජ්‍ය දැව සංස්ථාවෙන් ගස් පිළිබඳ තක්සේරුවක් ලබා ගෙන නොතිබුණි.

(උ) ගස් කැපීම සඳහා රු.70,000 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණද, ගස් කැපීමට ප්‍රථම ගෙවීම සිදු කර තිබුණි. කෙසේ වුවද, 2009 මැයි 22 දින රු.35,000 ක මුදලක් පමණක් විශ්ව විද්‍යාල ගිණුමේ තැන්පත් කර තිබුණු අතර, 2010 ඔක්තෝබර් 18 දින ඉතිරි රු.35,000 තැන්පත් කර තිබුණ.

**2.1.6 ගුණාත්මක උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය (IRQUE) යටතේ "PABX" ක්‍රමය ප්‍රසම්පාදනය කිරීම**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජූන 24 දින රු. මිලියන 3.4 ක පිරිවැයකට මිලදී ගෙන තිබූ උපකරණ සවි කිරීමෙන් හෝ අදහස් කළ කාරණයට උපයෝජනය කිරීමෙන් තොරව දුරකථන ක්‍රියාකරුගේ කාමරයේ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) උපකරණ ප්‍රසම්පාදනය කිරීමට පෙර ජාල පද්ධතිය සැපයීම හා සවි කිරීම පිළිබඳ පූර්ව සැලසුමක් කර නොතිබූ හෙයින් "PABX" ක්‍රමය සඳහා විධිමත් අවශ්‍යතා තක්සේරුවක් සිදු කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 වගන්තිය ප්‍රකාරව මිල කැඳවීම් 5 ක් ලබා ගැනීම වෙනුවට මිල කැඳවීම් 2 ක් පමණක් ලබාගෙන මෙම උපකරණය ප්‍රසම්පාදනය කර තිබුණි.

(ඈ) IP පදනම් "PABX" ක්‍රමය පිළිබඳ තාක්ෂණික නිපුණතා නිලධාරියෙකුගෙන් තාක්ෂණ ඇගයීම් කමිටුව (TEC) සමන්විත නොවීය. ඒ වෙනුවට විද්‍යා පීඨයේ පීඨාධිපති, නීති තාක්ෂණික ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල්) හා ගුණාත්මක උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ (IRQUE) නියෝජ්‍ය අධ්‍යක්ෂගෙන් කමිටුව සමන්විත විය.

### 2.1.7 රඳවා ගැනීමේ බදු (WHT) දෙවරක් ගෙවීම

-----------------------------------------------

කොළඹ, පෞද්ගලික සමාගමකින් නිල ඇඳුම් මිලදී ගැනීම සඳහා රු.102,600 ක මුදලක් දෙවරක් ගෙවා තිබුණි. තවද, රු.5,130 ක් වූ රඳවා ගැනීම් බදුද (WHT) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත දෙවරක් ගෙවා තිබුණි.

### 2.1.8 ආර්ථික නොවූ ගනුදෙනු

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ විවිධ නිලධාරීන්ට වාහන කුලී ගාස්තු වශයෙන් 2010 වර්ෂය තුළදී රු.2,911,409 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, වාහන කුලියට ගැනීම සඳහා ටෙන්ඩර් / මිල කැඳවීම් පරිපාටිය අනුගමනය කර නොතිබුණි.

(ආ) විශ්ව විද්‍යාලය මගින් ටෙන්ඩර් / මිල කැඳවීම් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව ප්‍රධාන ආපන ශාලාව ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංගමයට විශ්ව විද්‍යාල අරමුදල්වලින් රු.567,662 ක ගෙවීම් සිදු කර තිබුණි.

### 2.1.9 සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා (FHCS) අරමුදල් උපයෝජනය

------------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නෝර්වේහි "TROMSO" විශ්ව විද්‍යාලයෙන් රු.11,811,971 ක් වූ අරමුදල් විවිධ කටයුතුවලට ලබාගෙන තිබුණි. කෙසේ වුවද, "TROMSO" විශ්ව විද්‍යාලයේ හිටපු

සම්බන්ධීකාරක විසින් සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ නියමිත පොත්පත් හා වාර්තා පවත්වා නොතිබුණි.

(ආ) හිටපු සම්බන්ධීකාරක විසින් ලියකියවිලි, ඉන්වෙන්ටරි විෂයයන් හා ගිනුම් පොත්පත් සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ පීඨාධිපතිට භාර දී නොතිබුණි. ඒ හේතුවෙන් අරමුදල් අදහස් කළ කාරණයන්ට උපයෝජනය කළේද යන්න පිළිබඳව විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

(ඇ) ව්‍යාපෘති නිලධාරියාට විධිමත් පත්වීම් ලිපියක් විශ්ව විද්‍යාලය විසින් නිකුත් කර නොතිබුණු අතර, විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයාගේ හෝ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයේ පීඨාධිපතිගේ අනුමැතියකින් තොරව එම නිලධාරියා විසින් සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ කොටසක් භාවිතා කර තිබුණි.

## 2.1.10 පීඨයන්හි බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳ මූල්‍ය පාලනය

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) බොහෝ වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් විසින් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. සමහර අවස්ථාවලදී 2009 වර්ෂයේ සිට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල නොතිබුණි.

(ආ) මුදල් පොත් විධිමත්ව පවත්වා නොතිබුණු අතර, සමහර අවස්ථාවලදී මුදල් පොත් යාවත්කාලීන කර නොතිබුණි.

(ඇ) බැංකු ගිණුම් පවත්වා ගැනීම සඳහා විශ්ව විද්‍යාලයේ අදාල පීඨ මණ්ඩලවල හා සනාථන සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඈ) පීඨවල පවත්වාගෙන යන වැඩසටහන් සඳහා සම්බන්ධීකාරකවරුන් පත් කිරීමේදී පත්කිරීම් අධිකාරිය වන උපකුලපති විසින් පත් කිරීමෙන් තොරව අදාල පීඨවල පීඨාධිපතිවරුන් විසින් පත් කර තිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි සහ වෙනත් පිළිගත් මූල්‍ය පරිපාටිවලට පටහැනිව සැපයුම්කරුවන් නමින් ලියා තිබූ රු.1,945,012 ක් වටිනා චෙක්පත් 17 ක් මිලදී ගැනීම් නිලධාරි (PO) විසින් භාරගෙන ඔහු පෞද්ගලිකවම සැපයුම්කරුවන්ට නිකුත් කර තිබුණි. එම නිලධාරියා භාණ්ඩ / ද්‍රව්‍ය ප්‍රසම්පාදනය සඳහා යෙදී සිටි බවද මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය විය.

### 2.1.11 පරිගණක 155 ක් හා අඛණ්ඩ බල සැපයුම් (UPS) 06 ක් ප්‍රසම්පාදනය කිරීම

සමාලෝචිත වර්ෂයේ ගුණාත්මක උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාලතවය වැඩි දියුණු කිරීමේ (IRQUE) ව්‍යාපෘතිය යටතේ පරිගණක 155 ක් හා අඛණ්ඩ බල සැපයුම් 06 (UPS) ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා 2010 අගෝස්තු 03 දින රු.14,559,150 ක මුදලක් ගෙවා තිබුණි. ජාත්‍යන්තර මෘදුකාංග සමාගමකින් පරිත්‍යාග ලෙස ප්‍රමාණවත් "License Keys" තොගයක් ලැබී තිබුණද, රු.5,186,455 කට ඇස්තමේන්තු කරන ලද "License Keys" (Windows Vista Business Downgraded to XP Professional Original OEM licence) 155 ක් ඇතුළත්ව පරිගණක 155 ක ප්‍රසම්පාදනය සඳහා ඇණවුම් කර තිබුණු බව මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය විය.

කෙසේ වුවද, එසේ මිලදී ගන්නා ලද "License Keys" රු.1,395,000 ක් වටිනාකම වූ පරිගණක (Personal Computers) 15 ක් සහ අඛණ්ඩ බල සැපයුම් (UPS) 15 ක් සඳහා හුවමාරු කරමින් සැපයුම්කරුට ආපසු යවා තිබුණි. මෙම ගනුදෙනුවේ ප්‍රතිඵලයක් ලෙස රු.3,791,455 ක අලාභයක් විශ්ව විද්‍යාලයට සිදු වී තිබුණි.

## 2.2 කාර්ය සාධන සමාලෝචනය

### 2.2.1 අධ්‍යයන අංශ කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යයන වර්ෂ 5 ක් සඳහා එක් එක් පීඨයේ කටයුතු සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ලියාපදිංචි වූ ශිෂ්‍යයින් සංඛ්‍යාව සහ සමර්ථ වූ සංඛ්‍යාව පහත දැක්වේ.

| අංශය | ලියාපදිංචි වූ ශිෂ්‍යයින් සංඛ්‍යාව | | | | | | සමර්ථ වූ ශිෂ්‍යයින් සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 |
| කෘෂිකර්ම | 28 | 32 | 32 | 26 | 49 | 46 | 17 | 28 | 24 | 60 | 28 | 16 |
| වාණිජ සහ කළමනාකරණ | 63 | 49 | 64 | 174 | 231 | 162 | 123 | 88 | 76 | 100 | 61 | 47 |
| කලා | 173 | 198 | 312 | 151 | 342 | 253 | 184 | 161 | 260 | 155 | 221 | 296 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විද්‍යා | 52 | 54 | 56 | 114 | 38 | 88 | 26 | 46 | 85 | 81 | 43 | 12 |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාව | - | 27 | 36 | 55 | 72 | - | - | - | - | - | - | - |
| එකතුව | 316 | 360 | 500 | 520 | 732 | 549 | 350 | 323 | 445 | 396 | 353 | 371 |

(ආ) ශිෂ්‍යයින් ලයාපදිංචි කිරීම
---------------------------

(i) 2009 වර්ෂය සඳහා විශ්ව විද්‍යාලයේ නවක ශිෂ්‍යයින් 732 ක් ලියාපදිංචි වී තිබුණි. කලා පීඨයට 342 ක් එනම් 47% ක්, කෘෂිකර්ම පීඨයට 49 ක් එනම් 7% ක්, වාණිජ හා කළමනාකරණ පීඨයට 231 ක් එනම් 31% ක්, විද්‍යා පීඨයට 38 ක් එනම් 5% ක්, සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨයට 72 ක් එනම් 10% ක් වශයෙන් මෙම උපාධි අපේක්ෂකයන් සමන්විත වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළදී උපාධි ලබාගත් ශිෂ්‍යයින් සංඛ්‍යාව 353 ක් විය. කෘෂිකර්ම පීඨයෙන් 28 ක්, කලා පීඨයෙන් 221 ක්, වාණිජ හා කළමනාකරණ පීඨයෙන් 61 ක් හා විද්‍යා පීඨයෙන් 43 ක් වශයෙන් මෙම උපාධිධාරීන් සමන්විත වී තිබුණි.

(ඇ) නේවාසිකාගාර පරිපාලනය
------------------------------

ශිෂ්‍යයින් 680 ක් සඳහා නෙවාසිකාගාර පහසුකම් සපයා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද නේවාසිකාගාර වියදම රු.9,344,789 ක් වූ අතර එක් ශිෂ්‍යයෙකුට නේවාසිකාගාර වියදම රු.13,742 ක් විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රු.277,920 ක් පමණක් ශිෂ්‍යයින්ගෙන් අයකර ගෙන තිබුණි.

(ඈ) පවත්වන ලද විභාගවල ප්‍රතිඵල
---------------------------------

විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ විභාගවලට පෙනී සිටි ශිෂ්‍යයින් සංඛ්‍යාව සහ සමර්ථ වූ සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පීඨය | විභාගය පවත්වන ලද කාලපරිච්ඡේදය | විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමර්ථ වූ ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| කෘෂිකර්ම | 2010 මාර්තු, අප්‍රේල්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් | 221 | 80 |
| කලා | 2010 මාර්තු, අප්‍රේල් , ජූනි, ජූලි, ඔක්තෝබර් සහ නොවැම්බර් | 1731 | 1,481 |
| වාණිජ හා කළමනාකරණය | 2010 පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, මැයි, ජූනි, ජූලි, සැප්තැම්බර්, නොවැම්බර් සහ දෙසැම්බර් | 456 | 340 |
| විද්‍යාව | 2010 පෙබරවාරි, මාර්තු, අප්‍රේල්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් | 540 | 167 |
| සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාව | 2010 ජූනි, ජූලි, නොවැම්බර් සහ දෙසැම්බර් | 9 | 59 |
| | එකතුව | 3,027 | 2,127 |

(ඉ) ඒක ශිෂ්‍ය පිරිවැය

විශ්ව විද්‍යාලයේ පාඨමාලා 07 වෙනුවෙන් ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2,325 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.459,417,277 ක් විය. වර්ෂය සඳහා එක් ශිෂ්‍යයෙකුට සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු.197,598 ක් විය.

(ඊ) මහපොළ හා ශිෂ්‍යාධාර

ශිෂ්‍යයින් 596 ක් සඳහා මහපොළ ආධාර වශයෙන් රු.15,290,000 ක් ගෙවා තිබුණු අතර ශිෂ්‍යයින් 836 ක් සඳහා ශිෂ්‍යාධාර වශයෙන් රු.16,505,000 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

(උ) පුස්තකාල පරිපාලනය

පුස්තකාලයෙන් පොත් ලබා ගත් ශිෂ්‍යයින්, අධ්‍යයන කාර්ය මණ්ඩලය හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසන් නිශ්චිත කාල පරිච්ඡේදය තුළ පොත් 385 ක් ආපසු භාරදී

නොතිබුණි. මෙම පොත් පුස්තකාලයට ආපසු ලබා ගැනීම සම්බන්ධයෙන් හා හානි වූ පොත් සම්බන්ධයෙන් විධිමත් පියවර ගෙන නොතිබුණි.

### 2.2.2 විගණන හා කළමනාකරණ කමිටු

------------------------------------

සමාලෝචිත වර්ෂය තුළද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 11 ක් පවත්වා තිබුණි. කමිටුව රැස්වීම් කිහිපයකදීම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී විගණන විමසුම් 07 කට පිළිතුරු සැපයීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 බැඳුම්කර හා ගිවිසුම් කඩකිරීම්

---------------------------------

ශිෂ්‍යත්ව මත විදේශගතව සිටින විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරුන් 57 දෙනෙකු ශිෂ්‍යත්වය නිම කිරීමෙන් පසුව දිවයිනට ආපසු නොපැමිණ හෝ විශ්ව විද්‍යාලයෙන් ඉවත් වී ගොස් හෝ තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිවිසුම්වල ප්‍රතිපාදන කඩකළ හා ඇපකරයේ වටිනාකම නොගෙවූ නිලධාරීන් 57 කගෙන් රු.70,407,561 ක් අයකර ගැනීම සඳහා විධිමත් පියවර ගෙන නොතිබුණි. රු.55,501,765 ක්, රු.1,747,170 ක්, රු.9,617,877 ක් සහ රු.3,540,748 ක් ඇතුළත් අයවියයුතු මුදල පිළිවෙලින් වර්ෂ 5 ට වැඩි, වර්ෂ 4 සිට 5 දක්වා, වර්ෂ 1 සිට 3 දක්වා සහ වර්ෂ 1 ට අඩු වශයෙන් හිඟව පැවතුණි.

(ආ) ඇපකරවල මුදල් වටිනාකම ආපසු නොගෙවූ කථිකාචාර්යවරුන් සම්බන්ධයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7:8 වගන්තිය ප්‍රකාරව අදාල පාර්ශවයන් වෙත දැනුම් දීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 නොවිසඳුනු ප්‍රශ්න

--------------------

ඉකුත් වර්ෂය සඳහා වූ විශ්ව විද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද පහත දැක්වෙන කරුණු 2011 අගෝස්තු 31 වන විටත් නිරවුල් කර නොතිබුණි.

| ගිණුම් වර්ෂය | වාර්තාවේ ජේදවලට යොමුව | විස්තර |
| --- | --- | --- |
| 2009 | 2.2.3 | ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම් |
| | 2.2.4 | බැංකු සැසඳුම් ප්‍රකාශනවල අඩුපාඩු |
| | 3.1.5 | හඳුනා ගන්නා ලද පාඩු |

**2.2.5 සංයුක්ත සැලැස්ම**

-------------------

2003 සිට 2007, 2007 සිට 2011 සහ 2010 සිට 2015 දක්වා සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණද, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර අදාල තොරතුරු සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණු අතර, එය වාර්ෂිකව යාවත්කාලීන කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

-------------------

පද්ධති හා පාලන පිළිබඳ විගණනයේදී නිරීක්ෂණයවූ අඩුපාඩු විගණන නිරීක්ෂණ මගින් වරින්වර විශ්වවිද්‍යාලයේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) අත්තිකාරම් නිරවුල් කිරීම

(ආ) වාහන උපයෝජනය

(ඇ) ස්ථාවර වත්කම්

(ඈ) බැංකු සැසඳුම් ප්‍රකාශන

(ඉ) අයවැය